සන්නස

# හෙළ බසේ වියරණ

> ...... ව්‍යාකරණය නම් භාෂා නීතියයි. එක් එක් භාෂාවේ ව්‍යාකරණය ඒ ඒ භාෂාවේ ව්‍යවහාරයෙන් විනිශ්චය කරනු ලැබේ. එහෙයින් ව්‍යාකරණ කාරයා විසින් කළ යුත්තේ තමා ව්‍යාකරණ සපයන භාෂාවේ ව්‍යවහාරය බලා,අළලා, පෙරා, කිරා, පිඬු කොට දැක්වීමයි.
>
> \- කුමාරතුංග මුනිදාසයන්

සිංහල භාෂාව පිරිහෙන්නේ යයි ඇතැම් දෙනෙක් මැසිවිලි නගති. මේ චෝදනාව නගන්නන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි යයි මම සිතමි.

මිනිසුන් වහරන බසක් වෙනස් වීම නොවැළැක්විය හැකි සිද්ධාන්තයකි. සමාජ, ආර්ථික වර්ධනය, නවීන විද්‍යා දියුණුව, ජන ජීවිතයේ සිරිත් විරිත් ඇතුළු සංස්කෘතිකාංග වෙනස් වීම ආදිය නිසා ඕනෑම බසකට නව වදන් එකතු වෙයි ඇතැම් පැරණි වදන් ගිලිහී යයි. නව අරුත් කීමට නව වදන් නිපදවීමට සිදුවෙයි. මේ අනුව භාෂාවද වෙනස් වෙයි. මේ විපර්යාසය අවබෝධ කර ගැනීමට අසමත් පිරිස 'අනේ අපොයි භාෂාව පිරිහෙනවා'යි මැසිවිලි නගමින් වැළපෙති. භාෂාව සරල බවින් මිදී 'සංකීර්ණ ස්වරූපයක්' ගන්නා බව වටහාගත නොහැකි මේ පිරිස තමා අවට වෙනස් වන ලෝකයට මුහුණ දීමට අපොහොසත්ව තමාට සුරක්ෂිත බවක් ලබා දුන් අතීතයට පළා යති. භාෂාවක් පිරිහෙනනේ යයි මැසිවිලි නගන පළමු කොටස ලෙස හා හඳුන්වන්නේ මේ පිරිසයි.

තවත් පිරිසක් භාෂාව වෙනස් වීම ගැන උපේක්ෂාවෙන් බලමින් එය ස්වභාවික සංසිද්ධියක් ලෙස බාර ගැනීමට මැලි නොවෙති. වෙනස් වීමේ හෝ වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස භාෂාව වල්මත් වනු දක්නට ලැබෙන්නේ නම් ඒ සඳහා නිසි බස් වහර හඳුන්වා දීමෙන් බස රැක ගන්නට තැත් කරන මේ පිරිස ඕනෑම ජීව භාෂාවක අවිච්ින්න පරිණාමය හඳුනා ගත් විදග්ධ පිරිසකි.

මේ දෙවන පිරිසට ඇතුලත් කළ හැකි අදහස් සහිත පොතක් ඕස්ට්‍රේලියාවේ පළ වී තිබේ. 'සරල සිංහල වියරණ විදි' "Simple Sinahala Grammer" නම් වූ ඒ පොත් පිංච ලියා ඇත්තේ මෙල්බර්න් නගරයේ සිටින ඩී. බී. කුරුප්පු මහතාය.

'සරල සිංහල වියරණ විදි' පොත් පිංච මා ඉදිරිපත් කළ දෙවන ගණයේ වියතකුගේ අදහස් ගෙන හැර දක්වන්නක් බව පහත දැක්වෙන පාඨයෙන් හෙළි වෙයි.

'..... බස ඇවැසි පරිදි වෙනස් වනු දකින්නටත් ඒ ඉවසන්නටත් අප සමත් විය යුතුය. ඒ වෙනස් වීම චාරයක් ඇතුව සිදු වීමද අවශ්‍යය. බස සතු එම චාරය හැඳින්විය යුත්තේ එහි වියරණය නමින් ය. වියරණය යනු සීමා බන්ධනයක් නොව මං හසර දක්වන්නක් නොහොත් යා යුතු මග පැහැදිලි කරන උපදෙස් පෙළක් විය යුතුය' (පිට 13)

මෙය ඉතා වැදගත් අදහසකි. මා දන්නා පරිදි සිංහල උගතුන් බොහොමයක් ලියන භාෂාවේ වියරණ දොස් දක්වමින් හඬ නගන්නේ වියරණය වෙනස් නොවන සංසිද්ධියක් ලෙස සලකාගෙනය. මිනිසුන් එදිනෙදා වහරන ජීව භාෂාවක් වන සිංහලයේ වෙනස් නොවන වියරණ නීති තිබිය නොහැකිය. වෙනත් ඕනෑම ජීව භාෂාවක් මෙන්ම සිංහලයද පොදු ජන වහර සමාජ සිරිත් හා ජන ජීවිතය ඇසුනේ නිරන්තරයෙන්ම වෙනස් වන බසකි. එවැනි බසක් වෙනස් නොවන වියරණ වැටකින් බැඳ තබන්නේ කෙසේද?

මා අදහස් කරන ලෙස නම් වියරණය විය යුත්තේ පොදු සම්මතයයි. පොදු සම්මතය යනු ඒ ඒ කාල වලදී පොදු ජනතාව වහරන බස යයි වැඩි දෙනෙකු විසින් සම්මතයෙන් පිළිගත් ව්‍යවහාරයයි. 'මම ගෙදර යමි' යන වැකිය නිවැරදි ලෙසත් 'මම ගෙදර යමු' යන වැකිය වැරදි ලෙසත් වර්තමානයේ පොදු සම්මතය වී ඇත. ඒ දෙවිදියෙන්ම කී විට මම නමැති තැනැත්තා ගෙදර ගිය බව වැටහේ. දෙවිදියෙන්ම කිවූ විට අර්ථාවබෝධයට බාධකයක් ඇති නොවේ. එහෙත් පොදු සම්මතය 'මම ගෙදර යමි' නිසා 'මම ගෙදර යමු'යි කීම සාවද්‍යයයි පිළිගැනීමක් ඇත. යම් කාලයකදී 'මම ගෙදර යමු' කීම නිවරුදි යයි පොදු සම්මතයක් ඇති කර ගතහොත් 'මම ගෙරද යමි'යි කීම සාවද්‍ය වී 'මම ගෙදර යමු'යි යන්න නිවරුදි ව්‍යවහාර වන්නට පුළුවන. මෙය එක් සරල උදාහරණයක් පමණි.

මා පහත දක්වන්නේ කුමාරතුංග මුනිදාසයන්ගේ ව්‍යාකරණ විවරණයේ (1935) සංඥාපනයෙන් උපුටා ගත් කොටසකි.

...... ව්‍යාකරණය නම් භාෂා නීතියයි. එක් එක් භාෂාවේ ව්‍යාකරණය ඒ ඒ භාෂාවේ ව්‍යවහාරයෙන් විනිෂ්චය කරනු ලැබේ. එහෙයින් ව්‍යාකරණ කාරයා විසින් කළ යුත්තේ තමා ව්‍යාකරණ සපයන භාෂාවේ ව්‍යවහාරය බලා,අළලා, පෙරා, කිරා, පිඬු කොට දැක්වීමයි.

කුමාරතුංගයන් මේ පවසන්නේ කුමක්ද? පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථ දැඩි ලෙස පරිශීලනයෙන් හා විමර්ෂණයෙන් සිංහලයට උචිත වියරණ නීති රීති සකස් කළ කුමාරතුංගයෝ පවා ව්‍යාකරණය පොදු ව්‍යවහාර යට පොදු සම්මතයට අනුව සකස් විය යුතු යයි පිළිගත් බව මේ කියමන අනුව හොඳින් පෙනී යන බව මගේ වැටහීමයි.

පොදු ව්‍යවහාරය පොදු සම්මතය අනුව සිංහලයේ වියරණ සකස් විය යුතු අතර එම වියරණ රීති කලින් කලට වෙනස් වීම ගැනද අවබෝධයකින් යුතුව සිටීම භාෂාවේ වර්ධනයට දායක වන සෑම ලේඛකයකුගේම යුතු කමක් හා වගකීමක් ලෙස මම සලකමි. භාෂා වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස අලුත් වදන් බසට එකතු වුවද, ගිලිහී නොදී අප විසින් රැක ගත යුතු වදන් හැම බසකට මෙන්ම සිංහලයේද ඇත. අවුරුදු දහස් ගණනක් භාවිත කිරීමෙන් උකහාගත් සිතුම් පැතුම් හා හැඟීම් ධ්වනිත කරන වදන් සිංහල ගැමි වහරේ ඇත. පොතින් පතින් උගත නොහැකි සිංහල උගත හැක්කේත් පරීක්ෂා කිරීමට යෝග්‍ය වචන ලැබෙන්නේත් අපේ පිටිසර ගම්වලදී යයි වැලිවිටියේ ශ්‍රී සෝරත හිමියෝ ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි ලා කීහ. කට වහරේ ඇති සිංහල වචන සියල්ලම පැරණි කම නිසා ඉවත් නොකර සමහරක් වත් රැක ගැනීම බසේ වැඩීම සඳහා ඉතාමත් එලදායි වනු ඇතැයි ඩී. බී. කුරුප්පු මහතා පවසන්නේත් මේ නිසාය (පිටු 61-62)

සිංහල බසේ වියරණය ගැන අවධානය යොමු කිරීමේදී වියරණය විය යුත්තේ ඒ ඒ කාලයේ පොදු ව්‍යවහාරයත් පොදු සම්මතයත් බව මම කීවෙමි. ඕනෑම කාලයක පොදු භාෂා සම්මතය පදනම් වන්නේ ඒ ඒ කාලයේ උගතුන්ගේ බස් වහරට අනුකූලව බව රහසක් නොවේ. උගතුන් විදග්ධයන් බහුශ්‍රතයන් වහරන වියත් වහර අනුසාරයෙන් බව රහසක් නොවේ. අපට දැනට ලැබී ඇති පැරණිම වියරණ ග්‍රන්ථය වන සිදත් සඟරාවේ පවා මේ බව සඳහන්ව ඇත. සිදත් සඟරාවේ පළමු පරිච්ඡේදය ලෙස හැඳින්විය හැකි 'සන් අදියර' හි මෙසේ දක්වා ඇත.

'සද'රුත් විදි සියල් - අනු රූ සේ පියෝ නත්
ඉති සන් සඳ සමස් ඇ - වහරනු සෙරෙන් සපයා
මේ සබඳ සිදත් පිරියක් හිමි

මෙහි අදහස නම් ශබ්ද ක්‍රම හා අර්ථ ක්‍රම සියල්ලම විවිධ ඡේක ප්‍රයෝගවලට අනුරූප වන බවය. ඒ අනුව සංඥා සන්ධි ආදිය ඒ ව්‍යවහාරයට අනුව සකස් කළ යුතු බවය.

මෙහි 'සේ පියෝ' යන්නෙන් අදහස් කරන්නේ 'ඡේක ප්‍රයෝග'යි ඡේකයෝ නම් බොහෝ ඇසූ පිරූ තැන් ඇති උගත්තුය. ඔවුන් ව්‍යවහාර කරන භාෂා ප්‍රයෝග ඡේක ප්‍රයෝගයි.

සිදත් සඟරාවේ එම අදහසට ඉතාම ආසන්න අදහසක් කුමරතුංගයන් පවසන්නේ මෙසේය

....ශුරයන්ගේ පත පොත කියවා බලා ඔවුන් යෙදූ සේ මැ බස යොදන්නෝ වෙත් මැයි. එසේ යොදන්නවුන් ව්‍යාකරණය නොදත් හයි සිතීම බලවත් මුලාවකි.... ඔවුන් භාෂාවේ රීති නීති .... නොදැනැ මැ භාෂා රීති නීති යොදන්නට පුරුදු වූහ (ව්‍යාකරණ විවරණය - සංඥාපනය)

ඩී. බී. කුරුප්පු මහතාගේ 'සරල සිංහල වියරණ විධි' පොත් පිංච කියවීමේදී මා තුළ සිංහල වියරණය පිළිබඳව කලක් තිසසේ පවතින අදහසක් යළි මතු විය. මේ සටහන ඒ අදහස හෙළි කිරීමට දැරූ ප්‍රයත්නයක් මිස 'සරල සිංහල වියරණ විධි' පොත පිළිබඳ විවරණයක් නොවේ.

ආචාර්ය පාලිත ගණේවත්ත

# ඩී බී කුරුප්පු ගේ "සරල සිංහල වියරණ විදි" කතරට වට දිය දෝතකි

ජගත් ජේ එදිරිසිංහ

**නොදන්නා කමට වරද්දන්නා වරද නිවැරදි කරගන්නට වැර වෑයම් කරයි. වැරදි නිවැරදි කරගන්නට කැමති කෙනෙක් වෙත් නම් ඩී බී කුරුප්පු මහතා ගේ "සරල සිංහල වියරණ විදි" පොත පරිශීලනය කළ යුතුම ය. මේ අධ්‍යයනය ඇරඹිය යුත්තේ උක්ත ආඛ්‍යාත සම්බන්ධතාව පිළිබඳ මූලික වැටහීමක් ලබා ගනිමින් ය. කුරුප්පු මහතා සිය පොතේ "උක්තාක්ඛ්‍යාත සම්බන්ධය" පරිච්ඡේදයෙන් උත්සහ කරන්නේ මේ මූලික දැනීම ලබා දීමට ය.**

එක්තරා සිංහල ගුවන් විදුලියකට සම්බන්ධව සිටි මගේ හිතවතෙක් වතාවක් යම්කිසි ලියවිල්ලක් මා අතට පත් කළේ ය.

"මේකෙ සිංහල පොඩ්ඩක් හදලා දෙන්න පුලුවන්ද?" ඔහුගේ ඉල්ලීම විය.

මම ඒ ලියවිල්ලේ වූ වැරදි කීපයක් නිවැරදි කර දුන්නෙමි. ඊළඟ සතියේ ගුවන් විදුලි වැඩසටහනේදී ඔහු ඒ ලියවිල්ල කියවනු




මම අසා සිටියෙමි. මා පුදුමයට පත් කරමින් ඔහු ලියවිල්ල කියෙව්වේ මා කළ නිවැරදි කිරීම් කිසිවක් නොසළකා, එය කලින් තිබූ ආකාරයටම ය. පසු දිනෙක ඒ ලියවිල්ල අහම්බෙන් යළිත් මා අතට පත් විය. මගේ හිතවතා මා කළ සියලු නිවැරදි කිරීම් කපා දමා එය කළින් තිබූ ආකාරයමට සකස් කර තිබෙනු මම දුටුවෙමි. මා කළ නිවැරදි කිරීම් ඔහුගේ දැනුම අනුව වැරදි ලෙස ඔහු තේරුම් ගෙන තිබුණි.

අද වැරදි සිංහල අපේ සමාජයේ කොයි තරම් ස්ථාපිත වී ඇද්දැයි කිවහොත් නිවැරදි සිංහල, අපේ ඇත්තන්ට පෙනෙන්නේ වැරදි ලෙසට ය.

පුවත්පත් වලට ලැබෙන ලිපි වලින් සියයට අනූවකම ඇත්තේ වැරදි සිංහල ය. සිංහල ගුවන් විදුලි වලින් ඇසෙන්නේ ද වැරදි සිංහල ය. පුවත්පත් මගින් හා වෙනත් මාධ්‍ය මගින් නිවැරදි සිංහල පිලිබඳ කොයි තරම් හඬ නැගුවද ඒවා බීරි අලින්ට වීණා වාදනය කිරීමක් පමණක් වී ඇති සැටි දකින විට සිතේ ඇතිවන්නේ කණගාටුවකි.

නිෂ්ශබ්දතාව, අනන්‍යතාව, සාක්ෂරතාව, ප්‍රවීණතාව, සම්බන්ධතාව වැනි නිවැරදි වචන අද බොහෝ අය කියන්නේ ලියන්නේ නිෂ්ශබ්දතාවය, අනන්‍යතාවය, සාක්ෂරතාවය, ප්‍රවීණතාවය, සම්බන්ධතාවය ලෙස වැරදියට ය. "ය" යන්න "තාව" යන තද්ධිතය සමග

29 වන පිටුවට